# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

## அரச கணக்குகள் திணைக்களம்

## Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/AS/CMA/C'cular

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2012.12.20


රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 228 /2012

සියළුම ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙත,

### 2012 වර්ෂයේ ආදායම් ගිණුම

මු.රෙ.151 හි විධිවිධාන අනුව සියළුම ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආදායම් සංකේතය වෙනුවෙන් 2012 වර්ෂයේ ආදායම් ගිණුම් පිළියෙල කර, පරික්ෂා කර, අත්සන් කිරීමෙන් පසු 2013.03.31 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත සහතික කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

02. මෙ සම්බන්ධයෙන් 2010 ජනවාරි 01 දින සිට බලපාන පරිදි "උපලේඛණය 1 ආදායම් වර්ගීකරණය" සම්බන්ධයෙන් සංශෝධන සිදු කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු 2009 ජූලි 03 දිනැති, 1/2002 (x) චක්‍රලේඛය, 2011 මැයි 31 දිනැති,1/2002 (xi) චක්‍රලේඛය, 2011 ජූනි 28 දිනැති 1/2002 (xii) චක්‍රලේඛය, 2011 ජූලි 15 දිනැති 1/2002 (xiii) චක්‍රලේඛය හා 2010 දෙසැ.29 දිනැති 01/2010 චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. ඒ අනුව ඔබ ආයතනය වෙත පැවරී ඇති ආදායම් සංකේතාංක සඳහා වූ ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම්ව මේ සමග අමුණා ඇති ඩී.ජී.එස්.ඒ. ආදායම් 1 හා ඩී.ජී.එස්.ඒ. ආදායම් 2 ආකෘතිපත්‍ර භාවිතා කර එක් එක් ආදායම් සංකේතය සඳහා වෙන් වෙන්ව 2012 වර්ෂය සඳහා ආදායම් ගිණුම පිළියෙල කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

03. "ඩී.ජී.එස්.ඒ. ආදායම් 2" ආකෘතියෙහි සඳහන් අයිතම අංක යටතේ ආසන්න පසුගිය වර්ෂ 3 ට අදාළ අනුරූපී සංඛ්‍යා ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. එබැවින් අදාළ සංකේතයන් යටතේ ඒ ඒ වර්ෂයට අදාළ නිවැරදි ආදායම් සංඛ්‍යා දැක්වීම තහවුරුවනු පිණිස එකී වර්ෂවලට අදාළ අනුරූපී ආදායම් සංකේත නිවැරදිව නිශ්චය කර ගන්නා ලෙසත්, 2012 වර්ෂයේ ආදායම් ගිණුමේ ඇතුලත් සංඛ්‍යාවන් 2012 වර්ෂය සඳහා නිකුත් කෙරෙන භාණ්ඩාගාර අවසාන ගිණුම් ප්‍රකාශනයේ දැක්වෙන සංඛ්‍යාවන්ට සමාන වන බවට පරික්ෂාකාරි වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් සියළුම ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලද අංක 187/2006 දරණ 2006 සැප්තැම්බර් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.


මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk

Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898

Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733

04. පසුගිය වර්ෂවල විගණනය කරන ලද ආදායම් ගිණුම් සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් ප්‍රධාන අංශ පහක් යටතේ විගණන නිරික්ෂණ ඉදිරිපත් කර තිබුණි. එනම්

4.1 ආදායම් ඇස්තමේන්තු පුරෝකථනයේදි වඩාත් තාත්වික දත්ත උපයෝගි කර නොගැනීම හා පුරෝකථනය කල ඇස්තමේන්තු සංශෝධනය කළයුතු අවස්ථාවල ඒ පිළිබඳව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇස්තමේන්තු සංශෝධනය කිරිමට පියවර නොගැනීම.

4.2 හිඟ ආදායම් වාර්තා අර්ධ වාර්ෂිකව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවිය යුතු වුවත් එසේ නොකිරිම. හිඟ ආදායම් අයකිරිම් සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොවීම හා සංඛ්‍යාවල නිවැරදිතාවය තහවුරු කර ගැනීම නොහැකිවිම. එමෙන්ම උපලබ්ධි ආදායම් ලේඛණ සමඟ සැසඳීමේ අඩුපාඩු හිඟ ආදායම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකිරීම, හිඟ ආදායම් අයකර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග සතුටුදායක තත්ත්වයක නොවීම, එක් එක් වර්ෂයේ හිඟ ආදායම් වලින් රැස්කරන ලද ආදායම් වෙන වෙනම හඳුනාගත හැකි පරිදි වාර්තා පවත්වා නොතිබීම.

4.3 වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් ඔවුන්ගේ ගිණුම් සාරාංශ මඟින් ආදායම් ගිණුමට සිදුකර තිබු හර/බැර සටහන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම හර හා බැර නිවේදන සමඟ සසඳා නොතිබීම.

4.4 භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ දෙපාර්තමේන්තු ගිණුම් නොසැසඳිම.

උක්ත අඩුපාඩු 2012 ආදයම් ගිණුම් සකස් කිරිමේදී සිදු නොවිමට ක්‍රියාකරන මෙන් ඉල්ලා සිටින අතර විශේෂයෙන්ම මෙම ගිණුම සකස් කිරිමේදී 2012 විසර්ජන ගිණුමට අදාලව උපචිත ක්‍රමයට ගිණුම් තැබීමේ පදනම මත පිළියෙල කරන ආදායම් වියදම් ප්‍රකාශය සහ වර්ෂයේ අවසන් දිනට පිළියෙල කරන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ තොරතුරු සමඟ එකඟවිය යුතු බවද සලකන්න.

05. ඒ-4 ප්‍රමාණයේ කඩදාසියේ සඳහන්කර ඇති පරිදි "ඩී.ජී.එස්.ඒ. ආදායම් ආකෘති 1 සහ ඩී.ජී.එස්.ඒ. ආදායම් ආකෘති 2" යොදා ගනිමින් භාෂාත්‍රයෙන් තනි ලේඛණයක් ලෙස ආදායම් ගිණුම පිළියෙල කළ යුතු අතර, නිරවද්‍යතාවය පිළිබඳව ගිණුම් අංශය භාර ප්‍රධානියා විසින් පෞද්ගලිකවම තහවුරු කිරීමෙන් අනතුරුව ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් අත්සන් කිරිමෙන් පසුව 2013 මාර්තු 31 දින හා ඊට පෙර ලැබෙන පරිදි පිටපත් තුනකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ගිණුම අත්සන් කිරීමේදී ආකෘති පත්‍ර වලින් අපේක්ෂා කරන සියළුම තොරතුරු සඳහන් කර ඇති බවට පරික්ෂාකාරි වන ලෙසද ඉල්ලා සිටිනු ලැබේ.

06. ඩී.ජී.එස්.ඒ. ආදායම් ආකෘති 1 සහ ඩී.ජී.එස්.ඒ. ආදායම් ආකෘති 2 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ http/www.treasury.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර අවශ්‍ය නම් මෙම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(ගිණුම් සේවා) වෙත පෙන් ඩ්‍රයිව් (pen drive) සැපයී මෙන් එම තොරතුරු ලබාගත හැක. වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා අධ්‍යක්ෂ - ගිණුම් සේවා (දුරකථන අංක 011-2484753) නියෝජ්‍ය අධ්‍යක්ෂ - ගිණුම් සේවා (දුරකථන අංක 011-2484737) ඇමතීමෙන් ලබාගත හැකිය.

07. විගණකාධිපති විසින් විගණනය කරන ලද ආදායම් ගිණුම් වල පිටපත් පහත සඳහන් ආකාරයට බෙදා හැරෙනු ඇත.

1. මුල් පිටපත - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2. දෙවන පිටපත - අදාල අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව
3. තෙවන පිටපත - විගණකාධිපති විසින් රඳවා ගනු ලැබේ.

එන්.ජී දයාරත්න
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත

1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

# 2012 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම
# 2012திசம்பர் 31 ல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக்குடியரசு அரசாங்கத்தின் அரசிறை கணக்குகளின் பொழிப்பு
# Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka
## for the year ended 31st December 2012

ආදායම් ගණන්දීමේ නිලධාරි
அரசிறை கணக்கீட்டு உத்தியோத்தர்
Revenue Accounting Officer :

වියදම් ශීර්ෂ අංකය
செலவின தலைப்பு இல:
Expenditure Head No.

| ආදායම් සංකේතය<br>அரசிறை குறியீடு<br>Revenue code | ආදායම් සංකේත විස්තරය<br>அரசிறை குறியீடு விவரணம்<br>Description of Revenue Code | 2012 මූලික ආදායම් ඇස්තමේන්තුව<br>மூல அரசிறை மதிப்பீடு 2012<br>Original Revenue Estimate 2012 | 2012 සංශෝධිත ආදායම්ඇස්තමේන්තුව<br>திருத்திய அரசிறை மதிப்பீடு 2012<br>Revised Revenue Estimate 2012 | 2012 රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම<br>(දළ ආදායම- ආදායම් ආපසු ගෙවීම්)<br>சேகரிக்கப்பட்ட மொத்த தேசிய அரசிறை (அரசிறை மீளளிப்புகளை கழித்து) மொத்த அரசிறை 2012<br>Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2012 | 2011 රැස්කරන ලද මුළු ශු.ආදායම<br>(දළ ආදායම-ආදායම් ආපසු ගෙවීම්)<br>சேகரிக்கப்பட்ட மொத்த தேசிய அரசிறை (அரசிறை மீளளிப்புகளை கழித்து) மொத்த அரசிறை 2011<br>Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2011 |
|---|---|---|---|---|---|
| | | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. | රු./ ரூபா/Rs. |
| | | | | | |
| | එකතුව/ மொத்தம்/ Total | | | | |

මෙම සාරාංශ ප්‍රකාශයෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාරයේ ගිණුම් පොත් සමඟ සසඳා ලද බවත් තහවුරු කරමි.
இக்கணக்குகளில் காணப்படும் புள்ளி விபரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விரங்களுடன் ஒத்திருக்கின்றன வெனவும் இப்புள்ளி விரங்கள்
Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of

දිනය
திகதி
Date

ප්‍රධාන ගණකාධිකාරී/මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන
பிரதான கணக்காளரின்/நிதிப்பகுதியின் தலைவருடைய கையொப்பமும் பெயரும்
SIgnature and Name of Chief Accountant / Head of Finance

ආදායම් ගණන්දීමේ නිලධාරි නම,තනතුර සහ අත්සන
வருவாய் கணக்கீட்டு உத்தியோகத்தரின் கையொப்பமும் பெயரும் பதவியும்
SIgnature, Name and Designation of Revenue Accounting Officer

ඩී.ජී.එස්.ඒ - ආදායම්-2 / அ.க.ப.ந அரசிறை-2 /DGSA-Revenue-2

## 2012 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම
## (සෑම ආදායම් සංකේතයන් සඳහාම වෙනම ගිණුමක් පිළියෙල කළ යුතුය.)
## 2012டிசம்பர் 31 ல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக்குடியரசு அரசாங்கத்தின் அரசிறை கணக்குகளின் பொழிப்பு
## ( அரசிறை குறியீடு ஒவ்வொன்றிற்குமாக தயாரிக்கப்பட்டுள்து)
## Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka
## for the year ended 31st December 2012 (To be prepared for each Revenue Code)

| | | | | |
|---|---|---|---|---|
| | ආදායම් ගණන්දීමේ නිලධාරී<br>அரசிறை கணக்கீட்டு உத்தியோத்தர்<br>**Revenue Accounting Officer :** | | වියදම් ශීර්ෂ අංකය<br>செலவின தலைப்பு இல:<br>**Expenditure Head No.** | |
| 1 | I මෙම ගිණුමට අදාල ආදායම් සංකේතය :<br>II ආදායම් සංකේත විස්තරය : | I இக்கணக்கு தயாரிக்கப்பட்டுள்ள அரசிறை குறியீடு<br>II அரசிறை குறியீட்டின் விவரணம் | I Revenue Code for which this Account is prepared:<br>II Description of the Revenue Code: | |
| | | | | රු./ ரூபா/Rs. |
| 2 | පූර්ව මූදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් රැස්කිරීම — වර්ෂය - 1 (2011) | முந்திய மூன்று நிதியாண்டிற்கான தேறிய அரசிறை — ஆண்டு-1 (2011) | Net Revenue Collection for the three preceeding financial years : — Year - 1 (2011) | |
| | වර්ෂය-2 (2010) | ஆண்டு-2 (2010) | Year - 2 (2010) | |
| | (වර්ෂ 2009 සහ ඊට පෙර වර්ෂ) — වර්ෂය-3 (2009) | (2009 ஆண்டு மற்றும் முன்னைய வருடங்களும்) — ஆண்டு-3 (2009) | (year 2009 and previous years) — Year - 3 (2009) | |
| | <u>වාර්තා කරනු ලබන වර්ෂය සඳහා ගිණුම් විස්තර</u> | <u>அறிக்கையிடும் ஆண்டிற்கான கணக்கீட்டுத்தகவல்</u> | <u>Accounting Information for the Reporting year</u> | රු./ ரூபா/Rs. |
| 3 | මූලික ආදායම් ඇස්තමේන්තුව | மூல அரசிறை மதிப்பீடு | Original Revenue Estimate | |
| 4 | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | திருத்திய அரசிறை மதிப்பீடு | Revised Revenue Estimate | |
| 5 | දළ ආදායම් රැස්කිරීම | மொத்த அரசிறை மதிப்பீடு | Gross Revenue Collection | |
| 6 | සිදු කරන ලද ආපසු ගෙවීම | செய்யப்பட்ட மீளளிப்புகள் | Refunds made | |
| 7 | ශුද්ධ ආදායම් රැස්කිරීම | தேறிய அரசிறை மதிப்பீடு | Net Revenue Collection. | |
| | <u>හිඟ ආදායම් (තිබේ නම්)</u> | <u>அரசிறை நிலுவைகள் (ஏதாவதிருந்தால்)</u> | <u>Arrears of Revenue (if any).</u> | රු./ ரூபா/Rs. |
| 8 | පසුගිය වසරට පෙර වසර වන විට මුළු හිඟ මුදල් (දළ වටිනාකම) | முந்திய ஆண்டிற்கு முற்பட்ட ஆண்டுவரையுள்ள நிலுவைகள் | Arrears up to the year before the previous year. | |
| 9 | පසුගිය වසරට අදාළ හිඟ මුදල් (දළ වටිනාකම) | முந்திய ஆண்டின் தொடர்பில் நிலுவைகள் | Arrears in respect of the previous year. | |
| 10 | වාර්තා කරනු ලබන වසරට අදාල හිඟ මුදල් | அறிக்கையிடும் ஆண்டின் தொடர்பில் நிலுவைகள் | Arreas in respect of the Reporting year. | |
| 11 | ඉහත අයිතම (8+9+10) එකතුව | அறிக்கையிடும் ஆண்டின் முடிவில் மொத்த நிலுவைகள் (8,9,10) | Total Arrears as at the end of the Reporting year (8+9+10) | |
| 12 | වාර්තා කරනු ලබන වසර තුල අත්හරින ලද හා කපා හරින ලද මුළු ප්‍රමාණය | அறிக்கையிடும் ஆண்டின் தளர்த்தீடு செய்யப்பட்டு வபதிவழிக்கப்பட்ட தொகை | Total amount waived and written off during the Reporting year | |
| 13 | වාර්තා කරනු ලබන වසර තුල හිඟ මුදලට අනුරූපව රැස්කරන ලද මුළු ප්‍රමාණය | அறிக்கையிடும் ஆண்டில் நிலுவைக்கு எதிராக சேகரிக்கப்பட்ட மொத்த தொகை | Total amount collected against arrears during the Reporting year. | |
| 14 | වාර්තා කරනු ලබන වසර අවසාන වන විට ආදායම්වල මුළු ශුද්ධ හිඟ මුදල(11-12-13) | அறிக்கையிடும் ஆண்டின் முடிவில் இருந்தவாறான அரசிறையின் மொத்த தேறிய நிலுவைகள் (11-12-13) | Total Net Arrears of Revenue as at the end of the Reporting year (11-12-13). | |

| | | | | |
|---|---|---|---|---|
| | <u>විචල්‍යතාව විශ්ලේෂණය(අතිරික්තය/හිඟය) වාර්තා කරනු ලබන වසර සඳහා</u> | <u>மாறுபாட்டின் (மிகைக /குறைவு) பகுப்பாய்வு அறிக்கையிடும் ஆண்டு</u> | **<u>Variance (Excess/ (Shortfall) Analysis - Reporting year.</u>** | රු./ ரூபா/Rs. |
| 15 | මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර වෙනස | மூல அரசிறை மதிப்பீட்டிற்கும் திருத்திய மதிப்பீட்டிற்கும் இடையிலான மாறுபாடு | Variance between Original Revenue Estimate and Revised Revenue Estimate. | |
| 16 | සංශෝධිත ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම් රැස්කිරීම් අතර වෙනස | திருத்திய மதிப்பீட்டிற்கும் உள்ளபடியான தேறிய அரசிறை சேகரிப்பிற்கும் இடையிலான வேறுபாடு | Variance between Revised Revenue Estimate and Actual Net Revenue Collection. | |

17 ඉහත (15) හි සඳහන් විචල්‍යතාවයට හේතු / (15) இல் மாறுபாட்டிற்கான காரணங்கள்/ Reasons for the variance at (15) above:

18 ඉහත (16) හි සඳහන් විචල්‍යතාවයට හේතු / (16) இல் மாறுபாட்டிற்கான காரணங்களº/ Reasons for the variance at (16) above:

මෙම ගිණුමෙහි සඳහන් සියළුම සංඛ්‍යා, පවත්වා ගෙන යනු ලබන ගිණුම් පොත්වල සඳහන් සංඛ්‍යා සමඟ එකඟවන බවත්, ඒවා භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සසඳන ලද බවත් තහවුරු කරමි.

இக்கணக்குகளில் காணப்படும் புள்ளி விபரங்கள் வைத்திருக்கப்படும் கணக்குப் புத்தகங்களிலுள்ள புள்ளி விரங்களுடன் ஒத்திருக்கின்றன வெனவும் இப்புள்ளி விரங்கள் யாவும் திறைசேரி கணக்குப்புத்தகத்திலுள்ள புள்ளிவிபரங்களுடன் கணக்கிணக்கம் செய்யப்பட்டுள்ளன வெனவும் சான்றுப்படுத்தப்பட்டுள்ளன.

Certify that the figures appear in this Account are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

දිනය
திகதி
Date

ප්‍රධාන ගණකාධිකාරී / මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන
பிரதான கணக்காளரின்.'.நிதிப்பகுதியின் தலைவருடைய கையொப்பமும் பெயரும
**Signature and Name of Chief Accountant / Head of Finance**

ආදායම් ගණන්දීමේ නිලධාරී නම, තනතුර සහ අත්සන
அரசிறை கணக்கீட்டு உத்தியோகத்தரின் கையொப்பமும்,பெயரும்,பதவியும்
Signature, Name and Designation of Revenue Accounting Officer

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා / கணக்காய்வாளர் திணைக்களத்தின் உபயோகத்திற்கு/ For the use of Auditor General's Department.